විවිධ සෘණාත්මක සන්දර්භයන් තුළ -එනම් බොහෝ විට වරදක් සිදු වූ අවස්ථාවක- කාන්තා සහ පුරුෂ දෙපාර්ශවයම සහභාගි වූ අවස්ථාවක, කාන්තා පාර්ශවය පමණක් ඉස්මතු කොට දැක්වීම ඇතැම් මාධ්‍ය මගින් සිදුකරනා වරදකි. එහිදී කාන්තා පාර්ශවය පමණක් ඉස්මතු කිරීම ඔස්සේ දැක්වෙන්නේ, එකම වරද පිරිමියෙකු සහ කාන්තාවක් යන දෙදෙනාම සිදුකළත්, එහිදී කාන්තාවගේ වරදට වැඩි බරක් වැටෙනා බවක් හුවා දැක්වීමදැයි පාඨක අප ප්‍රශ්න කළ යුතුවේ.

මෙම තත්වයට උදාහරණ කිහිපයක් පහත ආකාරයට ඉදිරිපත් කළ හැක.

මෙහිදී අපට නිරීක්ෂණය කළ හැක්කේ, ඇතැම් පුවත් වාර්තාවන් මගින් කාන්තාවන් පමණක් ඉස්මතු කොට දැක්වීමත්, තවත් පුවත් වාර්තාවන් මගින් එසේ එක් ස්ත්‍රී පුරුෂ සමාජ භාවයක් පමණක් ඉස්මතු නොකිරීමත් වේ. මේ අනුව, කාන්තාවන් පමණක් ඉස්මතු කොට දක්වන පුවත් වාර්තාවන් කෙතරම් ආචාර ධාර්මිකදැයි අපට ඇසීමට සිදුවේ.

**#MediaEthicsSL #lka #sinhalanews #Lankadeepa #Mawbima**